Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2019 Public Examination

# Sinhala

## Continuers Level

**Wednesday 23 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2019*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 1**

1. Complete the table below. **3**

| **Suggested government changes** | **Expected outcome** |
| --- | --- |
| | |
| | |

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 2**

2. In the table below, outline the differences between Literature Day last year and this year. **6**

| **Last year** | **This year** |
|---|---|
| | |
| | |
| | |



PLEASE TURN OVER

Marks

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 3**

3. Identify six steps taken by the Principal to develop the school to its present state. **6**

- 
- 
- 
- 
- 
- 

**Part B** (Questions 4–6)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 4**

4. What was the purpose of the sister's phone call? Explain how the brother joked about it. **3**

   නංගී විසින් කරන ලද දුරකථන ඇමතුමේ අරමුණ කුමක් ද? සහෝදරයා විසින් එයින් විහිළු කළ අන්දම විස්තර කරන්න.

   Purpose
   අරමුණ

   ______________________________________________

   ______________________________________________

   Explanation
   විස්තරය

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

   ______________________________________________

Marks | You may make notes in this space. These notes will NOT be assessed.

**Text 5**

5. Describe the features of the environment and the activities of the people during the Sinhala New Year season. **6**

   සිංහල අලුත් අවුරුදු කාලයට ගමක පරිසරයේ ලක්ෂණ සහ මිනිසුන්ගේ ක්‍රියාකාරකම් විස්තර කරන්න.

   Environmental features

   පරිසරයේ ලක්ෂණ

   Activities of people

   මිනිසුන්ගේ ක්‍රියාකාරකම්

**Marks**

You may make notes in this space. These notes will NOT be assessed.

**Text 6**

6. State three different factors that have changed people's lifestyles, according to the text. Provide **one** example for each factor. 6

ඡේදයට අනුව, මිනිසුන්ගේ ජීවින රටාව වෙනස් කිරීමට බලපා ඇති එකින් එකට වෙනස් කරුණු තුනක් සඳහන් කරන්න. **එක් එක්** කරුණ සඳහා උදාහරණය බැගින් දෙන්න.

- ________________________________________
- ________________________________________
- ________________________________________

**End of Section 1**

BLANK PAGE

Student/Registration Number

Centre Number

**2019 PUBLIC EXAMINATION**

# Sinhala
## Continuers Level

### Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2019*

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

## මහනුවර නගරය

ශ්‍රී ලංකාවේ දෙවන විශාල නගරය වන මහනුවර නගරය, ලස්සන කඳු වැටි වලින් වට වූ, කඳුකර ප්‍රදේශයක පිහිටි නගරයකි. ශ්‍රී ලංකාවේ දිගම ගඟ වන මහවැලි ගඟ නගරය වටා, එය සාරවත් කරමින් ගලා බසියි. මේ නිසාම නගරයේ ඉතා සිසිල් දේශගුණයක් ද පවතී.

මහනුවර නගරයේ අලංකාරයට අමතරව ඓතිහාසික සහ ආගමික වශයෙන් ද වැදගත්කම් ඇත. ශ්‍රී ලංකාවේ අවසාන රජු රට පාලනය කළේ මහනුවර නගරයේ සිටය. බ්‍රිතාන්‍ය ආක්‍රමණයෙන් පසු රජතුමාව රටෙන් පිටුවහල් කළ ද, රජ මාළිගාව තවමත් බෞද්ධයන්ගේ ඉතා වටිනා සිද්ධස්ථානයක් ලෙස පවතියි. රජවරුන් මහනුවර රජකම් කරන කාලයේ සිටම, බුදුන්වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේව මාළිගාවේ වැඩ සිටුවා නිසි ගෞරවයෙන් රැක බලා ගැනීම රජතුමාගේ කාර්යයක් විය. දැන් දළදා මාළිගාව බෞද්ධ සිද්ධස්ථානයක් පමණක් නොව, විදේශිකයන් ආකර්ෂණය කර ගන්නා ස්ථානයක් බවට ද පත් වී ඇත. මහනුවර දළදා මාළිගාවේ සෑම වසරකම පවත්වන දළදා පෙරහැර විදේශිකයන් අතර ඉතා ප්‍රසිද්ධ සංස්කෘතික අංගයක් බවට පත් වී ඇත.

අපේ අවධානය දැන් යොමු වී ඇත්තේ මේ සුන්දර නගරයට සිදුවෙමින් පවතින පාරිසරික හානිය පිළිබඳවයි. කඳුවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගස් කපා දැමීමෙන්, කඳු නායයෑමේ තර්ජනයට ලක්ව ඇත. තවද, නගරයේ ජනගහණය අධික ලෙස වැඩිවී ප්‍රධාන පාර දෙපස කුඩා නිවෙස් සහ කඩ සාප්පු ඉදිකර ඇත. මෙම ඉදිකිරීම් නගරයේ අලංකාරය විනාශ කරමින්, තදබද වූ කඩපොළක ස්වභාවයක් ඇති කරවයි.

රටේ ආර්ථිකය සඳහා සංචාරක ව්‍යාපාරය වැදගත් වේ. එම නිසා විදේශිකයන් ආකර්ශණය කරන මහනුවර නගරයේ අලංකාරය රැක ගැනීමට, අනවසර ඉදිකිරීම් නවතා, නගරය වඩා සැලසුම් කිරීමට පියවර ගතයුතුය.

QUESTIONS

**Marks**

(a) Explain how the following factors have contributed to the prominence of the city of Mahanuwara, according to the text. **4**

- Geography
- History
- Religion
- Economy

(b) What are the recent concerns about the city? **2**

8. Read the text and then answer in ENGLISH the question that follows.

**ලෝක ළමා දිනය වෙනුවෙන් කුමාරි කරුණාරත්න මහත්මිය කළ දේශණයෙන් උපුටා ගත් කොටසක්.**

'අද මේ සිටින දරුවන් තමයි හෙට අපේ රටේ අනාගතය භාරගන්නේ. ඒ නිසා දරුවන්ව හොඳින් රැක බලා ගැනීම, ඔවුන්ව නිවැරදි මාර්ගයට යොමු කරවීම සහ ඔවුන්ට වටිනා මනුෂ්‍ය ගුණ ධර්මයන් කියා දීම, ඔවුන් තුල වටිනා ආකල්ප ගොඩ නැගීම, වැඩිහිටි අපගේ වගකීමයි.

දරුවන් රැක බලාගන්නවා කියන්නේ ඔවුන්ව හොඳින් පෝෂණය කර ඔවුන්ව ප්‍රසිද්ධ පාසල් වලට යවලා, අමතර පංති ගෙනියලා, විභාගවලට ඉහළම ප්‍රතිඵල ලබා දෙන එක නෙවෙයි. අනිවාර්යයෙන්ම දරුවන්ට හොඳ පෝෂණයක් මෙන්ම සුදුසු අධ්‍යාපනයකුත් අවශ්‍යයි. නමුත් එපමණකින්ම සමාජයට හොඳ මිනිසෙක් බිහිවෙන්නෙ නැහැ.

අප දරුවන්ට ඔවුන්ගේ ළමා කාලය, ගස්කොළන්, වැව් පොකුණු අතර විනෝද වීමට අවස්ථාවන් ලබා දෙන්න ඕනේ. ඔවුන්ට පරිසරයේ වටිනාකම තේරෙන්නේ එය අත්විඳින්න ඉඩ දුන්න විටයි. එතකොට පරිසරයට ආදරය කරන, එය රැක බලා ගන්න පරපුරක් බිහි වේවි. අද කාලයේ පරිසරයට කරන හානි පේනවා නේද? එහෙම වෙන්නේ පරිසරයේ ඇති වටිනාකම නොදන්නා නිසයි.

තව දෙයක් තමයි වැඩිහිටියන් දරුවන්ව අනවශ්‍ය ලෙස තරඟකාරී තත්ත්වයන්ට තල්ලු කර, ඔවුන්ව ආත්මාර්ථකාමී බවට පත්කිරීම. ඒ වෙනුවට ඔවුන් තුල අනිත් අය කෙරෙහි කරුණාව, බෙදා හදා ගැනීම, කළගුණ සැළකීම වැනි වටිනා මිනිස් ගුණ ධර්ම වර්ධනය කළ යුතුයි. මේ ගතිගුණ දරුවන්ට ඉගෙන ගැනීමට දෙමවුපියන්, වැඩිහිටියන් සහ ගුරුවරුන් ආදර්ශමත් විය යුතුයි.

දරුවන් අධ්‍යාපනයෙන් ලබන ජයග්‍රහණ අගය කරන තරමටම ඔවුන්ගේ හොඳ ගුණයන් ද අගය කිරීමට දෙමවුපියන් පුරුදුවන්න. එවිට ඔවුන් එම ගුණයන් වඩාත් වර්ධනය කරගන්න උනන්දු වේවි...'

QUESTION

**Marks**

Identify two values mentioned by the speaker and explain how adults can enable children to develop each value, as mentioned by the speaker. **4**

| **Value** | **How adults can enable children to develop this value** |
| --- | --- |
| | |
| | |

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 8.

පහත සඳහන් වන්නේ ඔබ මිලදී ගත් පරිගණකයට අදාලව පරිගණක වෙළඳසැලෙන් ඔබ වෙත නිකුත් කළ විස්තර මාලාවයි.

**ABC පරිගණක සපයන්නෝ**

වර්ගය – ABC පැවිලියන් 18

පරිගණකයේ විශේෂ පහසුකම්:

- ඉහළ කාර්ය ඵල සහිත දෘඪ තැටියක් (හාඩ් ඩිස්ක්) – මෙයින් වැඩසටහන් වේගවත් කරයි.
- ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුත් වෙබ් කැමරාවක්.
- වයි-ෆයි ජාල පහසුකම්.
- බ්ලූටූත් පහසුකම්.
- මවුසයකින් තොරව හැසිරවිය හැකි යතුරු පුවරුවක්.

මිල දී ගත් දිනය – 2019 අගෝස්තු 20

විකුණුම් මිල – ඩොලර් 1800

ශාඛාව – නගර ශාඛාව

වගකීම – වසර දෙකයි

<u>සැළකිය යුතුයි:</u>

වසර දෙකක වගකීම යටතේ ආවරණය වන්නේ පරිගණකයේ කොටස් හෝ වැඩසටහන්වල දෝෂ පමණි. භාවිතයේ දී සිදුවන කැඩීම් හෝ වෙනත් දෝෂ මෙයින් ආවරණය නොවේ.

කිසියම් ගැටළුවක දී වගකීම් සහතිකය ඉදිරිපත් කිරීමට වග බලාගන්න.

බලය නොලත් පරිගණක අළුත් වැඩියා කරන්නන් යටතේ අළුත් වැඩියා කිරීම් මගින් පරිගණකයට සිදුවන දෝෂ මෙයින් ආවරණය නොවන බව කරුණාවෙන් සළකන්න.

QUESTION

Within six months of purchasing the computer mentioned in Text 9, you realise that the computer programs are not functioning according to the specifications stated. Write a formal letter to the manager of ABC Computer Suppliers about your concerns to persuade him to provide a solution to your problem.

9 වන ඡේදයේ සඳහන් පරිගණකය මිල දී ගෙන මාස හයක් ඇතුළත දී, පරිගණක වැඩසටහන්, සඳහන් කර තිබූ විශේෂිත කරුණු අනුව ක්‍රියාත්මක නොවන බව ඔබට වැටහුනි. ABC පරිගණක සපයන්නෝ හි කළමණාකරු වෙත ඔබගේ කණස්සල්ල පලකර, එම ගැටළුවට විකල්ප විසඳුමක් ලබාදීමට ඔහුව පොලඹවන, විධිමත් ලිපියක් ලියන්න.

---

You may make notes in this space. These notes will NOT be assessed.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

Sinhala Continuers Level

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Question 9

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2019 Public Examination

# Sinhala
## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2019

**Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. Write an imaginative story about the clearing of the forests for a young adult creative writing competition, from the point of view of an elephant. Start your story with, 'Son, when I was your age I walked through the forest with my father, but now …'

    යෞවනයන්ගේ නිර්මාණාත්මක ලිවීමේ තරඟයක් සඳහා, කැළෑවක් එළිකිරීම පිළිබඳව අලියෙකුගේ ඇසින් දකින අන්දම ගැන මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න. ඔබේ කතාව 'පුතේ මම ඔයාගේ වයසේ දී මගේ තාත්තා එක්ක කැළෑව ඇතුලෙන් ඇවිදගෙන ගියා, ඒත් දැන් …' යන වාක්‍යයෙන් ආරම්භ කරන්න.

11. Write an informative article for a newspaper about what could happen to the coastal areas of Sri Lanka if the global temperature rises by 2 degrees Celsius and the ice caps melt. Suggest at least **three** ways in which an increase in the global temperature could be prevented.

    ගෝලීය උෂ්ණත්වය තව සෙල්සියස් අංශක 2 කින් ඉහළ ගොස් අයිස් වැස්ම දියවී යෑමෙන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවලට විය හැකි විනාශය පිළිබඳව විස්තරාත්මක ලිපියක් පුවත්පතකට ලියන්න. ගෝලීය උෂ්ණත්වයේ වැඩිවීම වළකා ගත හැකි ක්‍රම **තුනක්වත්** අවම වශයෙන් යෝජනා කරන්න.

12. Write the script for a speech to be delivered at your final school assembly, evaluating some satisfactory and unsatisfactory experiences you had while studying at your secondary college. Indicate the impact of these experiences on your life.

    ද්විතියික පාසලේ ඉගෙන ගන්නා කාලයේ දී ඔබ ලැබූ සතුටුදායක සහ අසතුටුදායක අත්දැකීම් පිළිබඳව ඇගයීමක් කරමින්, පාසලේ ඔබේ අවසාන රැස්වීමේදී පැවැත්වීමට නියමිත කථාවේ පිටපතක් ලියන්න. එම අත්දැකීම් ඔබේ ජීවිතයට ඇති කළ බලපෑම් පිළිබඳව ද සඳහන් කරන්න.

You may make notes in this space. These notes will NOT be assessed.

Question Number:

**End of Section 3**